www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව යුද අයවැයක් ගෙන එයි

## Sri Lankan government brings down a war budget

**සමන් ගුනදාස විසිනි**
**2006 දෙසැම්බර් 4**

මුදල් හා ආරක්ෂක ඇමති ධුර ද දරන ශ්‍රී ලාංකික ජනාධිපති මහින්ද රාජපක්ෂ නොවැම්බර් 16 දින ඔහුගේ අය වැය ලේඛනය ඉදිරිපත් කලේ ය. වැඩ කරන ජනයාගේ දැවෙන සමාජ අවශ්‍යතා සඳහා මුදල් වෙන් කිරීම පසෙක ලා දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහි යුද්ධය සඳහා විශාල මුදල් ප්‍රමානයක් වෙන් කර ඇති මෙම අය වැය යුද අය වැයකි.

රාජපක්ෂ 2005 නොවැම්බරයේ ඡන්දයෙන් බලයට පත් වූයේ දුප්පතුන්ට උදව් කිරීමේ දිගු පොරොන්දු ලැයිස්තුවකින් සමන්විත "මහින්ද චින්තන" ක්‍රියා මාර්ගය මතය. පුලුල් වන අය වැය පරතරය සීමා කරමින් මිලිටරිය සඳහා මුදල් සෙවීමේදී ජනාධිපති විසින් සියලු පොරොන්දු කඩ කරනු ලැබ තිබේ. පසු ගිය දෙසැම්බරයේ පලමු අය වැයෙන් ලබා දුන් සීමිත වැටුප් හා සහනාධාරයන් උද්ධමනයට හසුව සේදී ගොසිනි.

සම්පූර්න අය වැය වියදම රුපියල් බිලියන 834 (ඇ. ඩොලර් බි. 7.72) ක් වන අතර සම්පූර්න ආදායම රු. බිලියන 599ක් වන බැවින් දේශීය හා විදේශීය නය මගින් පියවා ගත යුතු මුදල රු. බිලියන 235කි. 2007 වසරේ ආරක්ෂාව සඳහා රු. බිලියන 139.6 ක් වෙන් කර ඇති අතර එය සියයට 45ක වැඩි කිරීමකි. 2006 දී ආරක්ෂක කටයුතු සඳහා රු. බිලියන 96ක් වෙන් කෙරුනු අතර වියදම ඊට වැඩි විය.

සන්ඩේ ටයිම්ස් පුවත් පත පෙන්වා දුන්නේ " කඩිමුඩියේ මිලිටරි සැපයුම් ලබා ගැනේ... ජනාධිපති රාජපක්ෂගේ පරිපාලනය තුල කෙරෙන ප්‍රධාන ගනු දෙනුවලින් එකක් වන මිග්-27 යානා 4ක් සඳහා යුක්රේනය සමග කොන්ත්‍රාත්තුවක් ඇති කර ගෙන තිබේ." මෑත මාසවලදී එල්ටීටීඊ සමග කල සටන්වලින් අහිමි වූ ප්‍රහාරක බෝට්ටු හා යුද්ධ ටැංකි ආදියේ අඩුව පුරවා ගැනීමටද සන්නද්ධ හමුදා සැලසුම් කරති.

ඊස්රායලයේ සෑදූ කෆීර් ප්‍රහාරක ජෙට් යානා විශාල වසයෙන් යොදා ගනිමින් එල්ටීටීඊයේ ස්ථානයන්ට හා ඉදි කිරීම්වලට පහර දෙන මිලිටරිය දිනපතා කෙරෙන ගුවන් ප්‍රහාර සඳහා විශාල මුදලක් වැය කරයි. යුද, නාවික හා ගුවන් හමුදා නව බඳවා ගැනීම් සඳහා යලිත් දැන්වීම් පල කර තිබේ.

එල්ටීටීඊ සටන්කරුවන්, මිලිටරි සාමාජිකයින් හා සිය ගනනක් සිවිල් ජනතාව ඇතුලුව 3000ක් පමන මේ වසර තුලදී උත්සන්න කෙරුනු සටන්වලින් මිය ගොසිනි. 240,000ක් පමන අවතැන්ව ඇති අතර ඉන් 16,000ක් දකුනු ඉන්දියානු තමිල්නාඩු ප්‍රාන්ත රාජ්‍යයට ගොසිනි. දශ ලක්ෂ බාගයක් පමන ජනයා ආහාර, බෙහෙත් හා අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය හිඟ උතුරු ප්‍රදේශයේ යාපන අර්ධද්වීපයේ සිර වී සිටිති.

එසේ තිබියදීත් උතුරු නැගෙනහිර යුද බිම්වල පමනක් නොව සමස්ත දිවයිනෙහි ම සමාජ වියදම් කපා දමා තිබේ. පිලිවෙලින් රු. බිලියන 51ක් හා 43ක් වන සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා වෙන් කිරීම්වල ඓක්‍යයටත් වඩා ආරක්ෂක වියදම බොහෝ වැඩිය. 2006 දී රු. බි. 136ක් වූ සහනාධාර ප්‍රමානය 2007 දී රු.බි. 127 දක්වා කපා හැර තිබේ. ආන්ඩුවේ දෙපාර්තමේන්තු හා "අඩු කාර්යක්ෂමතාවක් ඇති ව්‍යවසායන්" හි වියදම් සියයට 2 - 5 අතර ප්‍රමානයකින් කපා හැරේ.

"මා රට ගැන බලා ගත යුතු අතර ඔවුන් සියල්ල විඳ දරා ගන්නේ ය" යි ජනතාව ඔහු සමග පැවසූ බව රාජපක්ෂ කියා සිටියේ ය. එහෙත් ඉහල යන ජීවන වියදමට එරෙහිව දැනටමත් විරෝධතා හා වර්ජන ඇරඹී තිබේ. රු. 375ක ජීවන වියදම දීමනාවක් රජයේ කම්කරුවන්ට හා විශ්‍රාමිකයින්ට ලබා දීම හැරුනු කොට වෙනත් කිසි ම වැටුප් වැඩි කිරීමක් අය වැයට ඇතුල් කර නැත.

රාජපක්ෂ "කෘෂි නවෝදය" නමින් නව වැඩ පිලිවෙලක් යෝජනා කල ද යන්ත්‍රෝපකරන සඳහා සපයන නය හා බදු සහනවල ප්‍රධාන වාසිය ලැබෙන්නේ වඩා පොහොසත් ගොවීන්ට ය. දැවැන්ත නය බරින් මිරිකී දිවි ගලවා ගැනීමට සටන් වදින සිය දහස් ගනන් දුප්පත් ගොවීන්ට අය වැය මගින් සැලසෙන සහනයක් නැත.

සියයට 7ක වර්ධන වේගය පිලිබඳව සඳහන් කරමින් ආර්ථිකය ආටෝප කර පෙන්වීමට ජනාධිපති උත්සාහ

දැරීය.  මෙම වර්ධන වේගයට හේතු වූ සරල ප්‍රධාන කරුන වූයේ 2004 දී දිවයිනේ මුහුදු බඩ පලාත් විනාශයට පත් කල සුනාමියෙන් පසු කෙරුනු යලි ගොඩ නැංවීම්ය. ආසන්න වසයෙන් වසර දෙකකට පසුව ද, දිවි ගලවා ගත්තවුන් තවමත් නිසි හව්හරනයකින් තොරව ජීවත් වෙති. තවත් නිවාස 42,000ක් වත් අවශ්‍ය බව රාජපක්ෂ පිලිගත්තේ ය.

පසු ගිය වසරේ සියයට 3.6ක්ව පැවති උද්ධමනය මෙම වසර තුල සියයට 12ක් දක්වා පිම්මේ ඉහල නැගිනි. පුලුල් වන ආන්ඩුවේ අය වැය පරතරය පියවා ගැනීමට විදේශ නය ගැනීම හා ඉහල යන ඉන්ධන මිල මීට බල පෑ ප්‍රධාන සාධක වීය. 2006 දී තෙල් ආනයනය සඳහා වියදම ඩොලර් බිලියන 2.2 දක්වා, ඩොලර් මිලියන 550කින් ඉහල යනු ඇතැයි ගනන් බැලේ. මැද පෙරදිග රැකියා කරමින් ශ්‍රී ලාංකිකයින් විසින් සිය රටට එවන්නා වූ මුදල් මත ආර්ථිකය බොහෝ කොට රඳා පවතී. මෙම වසර තුල මෙම මුදල ඇ. ඩොලර් බිලියන 2.4 දක්වා ඉහල නැගිනි. රුපියලේ අගයට මුක්කු සැපයීම සඳහා මහ බැංකුව විසින් ඩොලර් මිලියන 390ක් වියදම් කල ද ඇ. ඩොලරයට එරෙහිව රුපියල සියයට 6කින් පහත වැටිනි.

2006 සඳහා ඍජු විදේශ ආයෝජන ඩොලර් බිලියනයක් ලැබෙන බවට ආන්ඩුව ඇස්තමේන්තු කල ද ලැබුනේ ඩොලර් මිලියන 600ක් පමනි. අය වැයට පෙර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙසේ අනතුරු ඇඟවී ය. "මෑත දී සිදු වූ ගැටුම් ඉහල යාම මගින් අනාගත ආර්ථික සමෘධිය කෙරෙහි අනතුරු ඇඟවීමක් එල්ල විය හැකිය... ආයෝජන ඉදිරියට යාමට ද එය බලපායි... වැඩෙන නය ගෙවීම්වල බර, බාහිර බලයයන්ට ආර්ථිකය ගොදුරු වීම උත්සන්න කරනු ලබයි."

වැඩෙන නොසන්සුන්තාවය පාගා දමමින් වෙලඳපල හිතකාමී ප්‍රතිසංස්කරන ඉදිරියට ගෙන යාමට සහය වන ලෙස රාජපක්ෂ වෘත්තීය සමිති නායකයන්ගෙන් ඉල්ලා සිටියේ ය. දුම්රිය, පෙට්‍රෝලියම්, විදුලිය, ජල සැපයීම, වරාය, තැපැල් සේවය හා බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ව්‍යාපාරිකයින් හා වෘත්තීය සමිති නිලධාරීන් ද ඇතුලු ජාතික එලදායිත්වය ඉහල නැංවීමේ "කාර්ය සාධක බලකායක්"ගොඩ නැගීම පිලිබඳව ඔහු නිවේදනය කලේය.

යටිතල පහසුකම් පිලිබඳ අයවැය යෝජනා, හා කෝපරේට් බදු අඩු මට්ටමක පැවතීම මහා ව්‍යාපාරයන් විසින් සාදරයෙන් පිලිගනු ලැබූවද, යුද්ධයේ ආර්ථික බලපෑම පිලිබඳව ඔවුහු උනන්දුව පල කරති. "සාමය සඳහා ව්‍යාපාර සන්ධානය" (බීපීඒ) මෙසේ අනතුරු ඇඟවී ය.

"ආරක්ෂක වියදම් සඳහා දැවැන්ත ලෙස මුදල් වෙන් කිරීම මගින් එලදායී ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම යට ගැසේ. රට තුල යුද තත්වයක් පවත්වා ගැනීම මගින් බාහිර ආයෝජකයින් වෙත එල්ල කෙරෙන්නේ ඍන සංඥාවකි."

එල්ටීටීඊය සමග සහයෝගීව කටයුතු කරන ද්‍රවිඩ ජාතික සන්ධානය හැරුනු විට සියලු ප්‍රධාන පක්ෂ අය වැයට පක්ෂව ඡන්දය පාවිච්චි කලහ. විපක්ෂයේ විශාලතම පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය පලමු වතාවට රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග සන්ධානයක් ගොඩ නගා ගනිමින් අය වැයට පෙර ම ඒ සඳහා ඡන්දය දීමට එකඟ වීය.

සිංහල අන්තවාදී පක්ෂ වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය එල්ටීටීඊයට එරෙහිව මිලිටරි ප්‍රහාරයන් උත්සන්න කරන ලෙස රාජපක්ෂ ආන්ඩුවට බල කර සිටීයි. ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් ලක්බිම සමග කල සාකච්ඡාවක දී ආරක්ෂක වියදම් ඉහල දැමීම අගය කල අතර ආන්ඩුව නිවැරදි ලෙස යුද්ධය ගෙන යන්නේ නම් "ජනතාව බඩගින්නේ සිටීමට සූදානම් ය"යි පැවසීය.

අයවැය මගින් පැහැදිලි වන කරුන වන්නේ රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයේ පූර්න බර දරන්නේ සිංහල, දෙමල හා මුස්ලිම් ආදී සාමාන්‍ය වැඩ කරන ජනතාව බවයි.

© www.wsws.org